# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14

2017 අප්‍රේල් - ජූනි

මානවශාස්ත්‍ර පීඨය

**ප්‍රතිබිම්බ කලා - IMAT – E 2015**

**චිත්‍රපට හා රූපවාහිනී මාධ්‍යයේ ක්ෂේත්‍ර හා සම්මුති**

**ප්‍රශ්න <u>පහකට</u> (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. චිත්‍රපට නිෂ්පාදන ක්‍රියාවලියේ මූලික පියවර මොනවාදැයි හඳුන්වා, ඉන් එක් අදියරක් පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් කරන්න.

02. චිත්‍රපට මාධ්‍යය හා රූපවාහිනී මාධ්‍යය අතර පවතින සමාන අසමානතා සන්සන්දනය කරන්න.

03. තිරරචනය යනු කුමක් දැයි හඳුන්වා, සිනමා හා රූපවාහිනී මාධ්‍යයේ දී එහි උපයෝගීතාව සැකෙවින් විමසන්න.

04. රූපවාහිනී භාෂාවේ මූලික සංඝටක හතර (04) නම් කොට ඒවා නිදර්ශනාත්මකව පැහැදිලි කරන්න.

05. සුදුසු වර්ගීකරණයක් භාවිත කරමින් ලංකාවේ නිර්මාණය වන ටෙලිනාට්‍ය ආකෘති පිළිබඳ විමසීමක් කරන්න.

06. චිත්‍රපටයක් නිර්මාණාත්මක අයුරින් සැකසෙන්නේ සංස්කරණ මැදිරියේදීය. සංස්කරණ ශිල්පියාගේ කාර්යභාර්ය විමසා බලමින් මේ කියමන තහවුරු කරන්න.

07. රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වා ඉන් එකක් පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් කරන්න.

08. ඩිජිටල් තාක්ෂණයේ ආගමනයත් සමග රූපවාහිනී මාධ්‍යයේ සිදු වී ඇති පරිවර්තනය පිළිබඳ සඟරාවකට සුදුසු ලිපියක් සම්පාදනය කරන්න. (මාතෘකාවක් ද යොදන්න.)

09. පහත දක්වා ඇති මාතෘකා අතරින් හතරකට (04) කෙටි සටහන් ලියන්න.

    i. අධ්‍යක්ෂණය
    ii. ඉසව් සමීක්ෂණය
    iii. පසුබිම් සංගීතය
    iv. දෘශ්‍ය ප්‍රයෝග
    v. කැමරාකරණය
    vi. පසුතල නිර්මාණය
    vii. වේශ නිරූපණය

**********************